# වී නිෂ්පාදනයේ ඵලදායිතාවය ඇස්තමේන්තු කරන්නේ කොහොමද?
## දැන ගැනීම ප්‍රයෝජනවත් වේවි.........

**ශ්‍රී ලංකාවේ දේශීය කෘෂිකාර්මික අංශය තුළ වී නිෂ්පාදනය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලබයි.** 1948 වසරේ නිදහස ලබා ගැනීමෙන් අනතුරුව, බලයට පත් සෑම රජයක් විසින්ම ආර්ථික සංවර්ධන වැඩසටහන් සහ උපාය මාර්ග සැකසීමේ දී වී වගාවේ සංවර්ධනය සඳහා ප්‍රමුඛත්වය දී කටයුතු කළේය. ග්‍රාමීය ජනතාවගේ සුබසාධනය සම්බන්ධයෙන් සැලකූ විට වී නිෂ්පාදනයත්, ඒ තුළින් සැපයෙන සේවා නියුක්තියත් ආර්ථික ක්‍රමය තුළ දරන දායකත්වය විශාලය.

> **ආංශික ඵලදායිතාවය මගින් නිරූපනය කරන්නේ, තනි නිෂ්පාදන සාධකයක් හා නිමැවුම අතර අනුපාතයකි.**

වී නිෂ්පාදනය, දළ දේශීය නිෂ්පාදිතයෙන් 3%ක ප්‍රතිශතයක් ගන්නා අතර කෘෂිකාර්මික අංශයේ නිෂ්පාදන සඳහා 18%ක දායකත්වයක් සපයයි. එය තනි බෝගයක් ලෙස ඉහළම දායකත්වයක් ලබාදෙන එකම බෝගය ද වේ. **මුළු ජනගහනයෙන් දශ ලක්ෂ 1.8 ක් සෘජුවම වී නිෂ්පාදනයේ නියැලී සිටින අතර ඊට අතිරේකව සහල් සැකසීම, ප්‍රවාහනය සහ අලෙවිය යන කාර්යයන් හි විශාල රැකියා අවස්ථාවන් ජනිත කොට තිබේ.**

ජනතාවගේ ප්‍රධාන ආහාරය සැපයීමත්, එමගින් ජනතාවගේ පෝෂණය හා ශක්තිය ලබාදීමත්, ගැන සැලකූ විට වී නිෂ්පාදනය සඳහා දේශීය ආර්ථික ක්‍රමය තුළ හිමිවන ස්ථානය සෙසු ක්ෂේත්‍රයන්ට වඩා ප්‍රමුඛත්වයක් ගන්නා බව සඳහන් කළ යුතුය.

දේශීය ආර්ථිකය තුළ මෙතරම් වැදගත් නිෂ්පාදනයක සංවර්ධනය සම්බන්ධයෙන් සැලසුම් සකස් කිරීමේ දී හා ක්‍රියාවට නැංවීමේ දී පර්යේෂකයන්ට, ව්‍යාප්ති කාරකයින්ට හා ප්‍රතිපත්ති සම්පාදකයින්ට එහි **ඵලදායිතාවය** පිළිබඳ නිර්නායකයන් අවශ්‍ය වේ. මේ නිසා **ඵලදායිතාවය** යන්නෙන් අදහස් කරනු ලබන්නේ කුමක්ද යන්න සලකා බැලිය යුතුය.

### ඵලදායිතාවය පිළිබඳ න්‍යායාත්මක විග්‍රහය

**න්‍යායාත්මකව ඵලදායිතාවය නිර්වචනය කරන්නේ යෙදවුම් / නිමැවුම් අනුපාතයක් ලෙසිනි.** එනම් කිසියම් භාණ්ඩයක අවසන් නිමැවුම ලබා ගැනීම සඳහා භාවිතා කරනු ලැබූ නිෂ්පාදන සාධකයන්ගේ අනුපාතයක් වශයෙනි. **යම්කිසි භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනය කිරීම සඳහා මූලික සාධක හතරක යෙදවුම් අවශ්‍යය (භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය සහ ව්‍යවසාය).** ඒ අනුව ඵලදායිතාවය දෙයාකාරයක දර්ශකයක් වශයෙන් භාවිතයට ගැනේ.

* **ආංශික සාධක ඵලදායිතාවය** Partial Factor Productivity (PFP)
* **මුළු සාධක ඵලදායිතාව** Total Factor Productivity (TFP)

මෙම දර්ශක මගින් ප්‍රදේශ අතර, රටවල් අතර හා කාලවකවානු අතර ඵලදායිතාවය මැනීම සිදු කරනු ලබයි.

### * ආංශික ඵලදායිතාවය

**ආංශික ඵලදායිතාවය මගින් නිරූපනය කරන්නේ, තනි නිෂ්පාදන සාධකයක් හා නිමැවුම අතර අනුපාතයකි.** බොහෝ විට, භාවිතාවන ආංශික ඵලදායිතා දර්ශකයන් වන්නේ භූමියෙහි ඵලදායිතාවය (එනම් නිශ්චිත වගා බිම් ප්‍රදේශයක ඵලදායිතාව (yield) හෝ නිශ්චිත වගා බිම් ඒකකයක නිශ්චිත බෝගයක ඵලදායිතාව) නිසා ශ්‍රම ඵලදායිතා දර්ශකයයි. මෙම දර්ශකයන් සම්මතයක් වශයෙන් රටවල් අතර, ප්‍රදේශ අතර සහ කාල වකවානු අතර ඵලදායිතාව සන්සන්දනය කිරීම සඳහා භාවිතා කෙරේ. ප්‍රදේශ අතර පසෙහි සශ්‍රීකත්වය හා කාලගුණික වෙනස්කම් මත ඵලදායිතාව වෙනස් විය හැකිය. දෙන ලද ප්‍රදේශයක ඵලදායිතාවයේ

> **වී නිෂ්පාදනයේ දී භූමිය සීමිත සාධකයක් බවට පත් වෙමින් තිබේ.**

වෙනස්වීම ඒ සඳහා භාවිතා කරන සම්පත්වල වෙනස් වීමට වඩා වැඩි වාර ගණනකින් දක්වන්නේ නම් එම දර්ශකයෙන් ආර්ථිකමය කාර්යක්ෂමතාවයේ වර්ධනයක් සිදු වී ඇති බව දක් වේ.

ඒ අනුව,

භූමියෙහි ඵලදායිතාව = නිමැවුම / භූමිය

ශ්‍රමයෙහි ඵලදායිතාව = නිමැවුම / ශ්‍රමය

ප්‍රාග්ධනයෙහි ඵලදායිතාව = නිමැවුම / ප්‍රාග්ධනය

> **කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් අතර නව තාක්ෂණය හා වැඩි දියුණු කළ නව දියුණු බීජ හා රෝපන ද්‍රව්‍ය හඳුන්වා දීම මෙන්ම ඒවා ගොවීන් අතර ප්‍රචලිත කිරීම ද වේ.**

ආදී වශයෙන් ආංශික ඵලදායිතාවය ගණනය කළ හැකිය

## මුළු සාධක ඵලදායිතාවය

**මුළු සාධක ඵලදායිතාව, විවිධ ප්‍රදේශවල ඵලදායිතාව සන්සන්දනය කිරීම සඳහා භාවිතා කරනු ලැබේ.** මෙමගින් නිෂ්පාදනය හා ඒ ඒ සාධකයන්ගේ පිරිවැය භාගයන් (Cost Share) බර තැබීමකින් අනතුරුව එකතු කළ සාධකවල (aggrigated) අගය හා නිමැවුමේ අගය අතර අනුපාතයක් වශයෙන් ගණනය කරනු ලැබේ.

මුළු සාධක ඵලදායිතාව = නිමැවුම / යෙදවුම්

නිමැවුමේ අගය / (භූමිය) (බර තැබූ අවයවය) + (ශ්‍රමය) (බර තැබූ අවයවය) + (ප්‍රාග්ධනය) (බර තැබූ අවයවය)

## වී නිෂ්පාදනයේ ඵලදායිතාවය මැනීම සඳහා භාවිතා කරන දත්ත සහ තොරතුරු මූලාශ්‍ර

ශ්‍රී ලංකාවේ විවිධ රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන මගින්, වී ඇතුළු විවිධ බෝග නිෂ්පාදනයන් පිළිබඳව දත්ත සහ තොරතුරු එකතු කිරීම හා විශ්ලේෂණය කිරීම සිදු කරනු ලැබේ. **ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව,** දේශීය කෘෂිකාර්මික අංශය තුළ සාර්ව මට්ටමේ පර්යේෂණ ගණනාවක් සිදු කර තිබේ. ඒ මගින් එකතු කරන ලද දත්ත සහ තොරතුරු ආශ්‍රයෙන් තුලනාත්මක විශ්ලේෂණයන් රාශියක් කර ඇති බවද සඳහන් කළ යුතුය.

වී නිෂ්පාදනය සම්බන්ධයෙන් ප්‍රධාන කන්න දෙකෙහිදීම **අස්වනු සමීක්ෂණය කිරීම** (Crop Cutting Survey) ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයකි. ඒ මගින් ප්‍රධාන කන්න දෙකේදීම දිවයිනෙහි මුළු වී නිෂ්පාදනය වගා වපසරිය, අස්වනු ලැබූ වගා වපසරිය, සහ අක්කරයක සාමාන්‍ය අස්වැන්න (ඵලදායිතාව) ගණනය කිරීම සිදු කරනු ලැබේ. මෙම දත්ත පදනම් කර ගත් දිවයිනේ වාර්ෂික වී නිෂ්පාදනය ඇස්තමේන්තු කරනු ලැබේ. මේ අනුව, ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින්, මුළු වී නිෂ්පාදනය සහ භූමියෙහි ආංශික ඵලදායිතාවය (අස්වනු ප්‍රමාණය/හෙක්ටයාරයකට) දක්වන නිර්නායකයන් ගොඩනගා තිබේ.

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වන්නේ නව තාක්ෂණය හා වැඩි දියුණු කළ නව දියුණු බීජ හා රෝපණ ද්‍රව්‍ය හඳුන්වාදීම මෙන්ම ඒවා ගොවීන් අතර ප්‍රචලිත කිරීමයි.** කෘෂිකර්ම දෙපාර්තමේන්තුව 1979 සිට මුළු දිවයිනම ආවරණය වන පරිදි ප්‍රධාන වශයෙන් වී වගාව ඇතුළු තෝරාගත් බෝගයන්ගේ නිෂ්පාදන වියදම් ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණයන් (Cost of Cultivation Survey) දෙකන්නය සඳහාම සිදු කරනු ලබයි. මෙහි ප්‍රධාන අරමුණ නවීන තාක්ෂණ භාවිතය සඳහා ගොවීන් යොමු වී ඇති ප්‍රමාණය, සෙසු යෙදවුම් හා බලශක්ති භාවිතය, යෙදවුම් පිරිවැය අස්වනු ප්‍රමාණය, නිෂ්පාදන මිල, ආදායම ආදී තොරතුරු සමීක්ෂණය කිරීමයි. ඒ සඳහා අවශ්‍ය විශ්ලේෂණයන් කිරීම, නිර්නායකයන් ගොඩනැගීම හා ඇස්තමේන්තු කිරීම මගින් අධීක්ෂණය සහ ඇගයුම් කාර්යයන් හි යොද ගැනීම ද සිදු විය. ඒ අනුව, ආදායම, නිමැවුම සහ ඵලදායිතාවය සම්බන්ධයෙන් ඇස්තමේන්තු ගතකළ පහත සඳහන් නිර්නායක වට්නාකම් ගොඩ නගා තිබේ.

- හෙක්ටයාරයකට ලබන ශුද්ධ ආදායම
- නිමැවුමේ එක් ඒකකයක් සඳහා ශුද්ධ ආදයම
- භාවිතාකළ ශ්‍රමයේ එක් ඒකකයක් සඳහා නිමැවුම

> **මුළු සාධක ඵලදායිතාව, විවිධ ප්‍රදේශවල ඵලදායිතාව සන්සන්දනය කිරීම සඳහා භාවිතා කරනු ලැබේ.**

- ආයෝජනයේ එක් ඒකකයක් සඳහා නිමැවුම
- හෙක්ටයාරයකට ලැබූ අස්වනු ප්‍රමාණය

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා**

**පුහුණු කිරීමේ ආයතනය,** මේ පිළිබඳව පර්යේෂණ ගණනාවක් සිදුකර තිබේ. එහි අලෙවි හා ආහාර ප්‍රතිපත්ති අංශය මගින් 1998/99 මහ කන්නය සඳහා දිවයිනේ වී වගා කරන ප්‍රධාන දිස්ත්‍රික්ක පහක විධිමත් ප්‍රශ්න මාලාවක් ආශ්‍රයෙන් නිෂ්පාදන පිරිවැය සමීක්ෂණයක් සිදු කරන ලදී. ඒ මගින් යෙදවුම් පිළිබඳ දත්ත (බිත්තර වී, රසායනික පොහොර, කෘෂි රසායන ද්‍රව්‍ය, ශ්‍රමය සහ බලශක්තිය) යෙදවුම් පිරිවැය, අස්වනු ප්‍රමාණය, නිෂ්පාදන මිල, අදයම ආදී තොරතුරු ගොවීන්ගෙන් ලබාගන්නා ලදී. ඒ ආශ්‍රයෙන් නිර්නායකයන් කිහිපයක් ගොඩනගා ගන්නා ලදී.

- අක්කරයකින් ලබන අස්වනු ප්‍රමාණය
- අක්කරයකින් ලබන දළ ආදායම
- අක්කරයක් වගා කිරීමෙන් ලබන ලාභය (පවුලේ යෙදවුම් ඇතුලත්ව/පවුලේ යෙදවුම් ඉවත්කොට)
- එක් ඒකකයක් සඳහා පිරිවැය (පවුලේ යෙදවුම් ඇතුලත්ව /පවුලේ යෙදවුම් ඉවත් කොට)
- ආයෝජනය සඳහා ලැබූ ආදායම ප්‍රතිශතයක් වශයෙන්

## වී වගාවේ ආංශික සාධක ඵලදායිතාවේ ප්‍රවනතා

ආංශික ඵලදායිතාවය යනු නිමැවුම හා එය නිෂ්පාදනය සඳහා යොදගන්නා ලද තනි සාධකයක් අතර සම්බන්ධතාවය පෙන්නුම් කරන නිර්නායකයක් බව ඉහතින් සඳහන් කරන ලදී. එම අවස්ථාවේ. සෙසු සාධකයන්ගේ බලපෑම නියතයක් වශයෙන් සැලකේ.

## භූමියෙහි ඵලදායිතාව

**වී නිෂ්පාදනයේ දී, භූමිය සීමිත සාධකයක් බවට පත්වෙමින් තිබේ.** මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ 1985 පමණ වනවිට, වගාකළ හැකි සියළුම ඉඩම් වී සහ වෙනත් බෝග සඳහා භාවිතා කොට අවසන් වී තිබුණි. මෙහිදී සලකා බලනු ලබන්නේ, නිෂ්පාදනයේ වර්ධනය හා වගා කරන ලද භූමි ප්‍රමාණයේ වර්ධනය අතර ඇති අනුපාතයයි.

අංක 01 වගුවට අනුව, ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදන දර්ශක මගින් පෙන්නුම් කරන්නේ මහ වාරිමාර්ග පහසුකම් යටතේ වගා කළ භූමියෙහි ඵලදායිතාව අදළ කාලය (1980 - 1999) තුලදී මහ කන්නයේ දී සහ යල කන්නයේ දී 23% වැඩි වී තිබීමයි. කෙසේ වෙතත්, **ශ්‍රී ලංකාවේ සුළු වාරි පහසුකම් යටතේ හා වැසි දිය යටතේ කෙරෙන වී නිෂ්පාදනයේ**

**වගුව - 01**

**ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය සම්බන්ධයෙන්**
**භූමියෙහි ඵලදායිතාවයේ ප්‍රවනතා (කි. ග්‍රෑ. / හෙක්.)**

| මහ කන්නය | | | | | යල කන්නය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂය | මහවාරි | සුළු වාරි | වැසි දිය | එකතුව | මහවාරි | සුළු වාරි | වැසි දිය | එකතුව |
| 1980 | 3555 | 2949 | 2339 | 2950 | 3420 | 2621 | 2385 | 2888 |
| 1981 | 3642 | 2716 | 2553 | 3007 | 3471 | 2730 | 2361 | 2934 |
| 1982 | 3762 | 3028 | 2614 | 3151 | 4127 | 3213 | 2569 | 3331 |
| 1983 | 4470 | 3406 | 2878 | 3641 | 4118 | 2222 | 2537 | 3605 |
| 1984 | 3496 | 3934 | 2583 | 3032 | 3598 | 3045 | 2484 | 3146 |
| 1985 | 4169 | 3327 | 2866 | 3496 | 3976 | 2997 | 2539 | 3342 |
| 1986 | 4166 | 3646 | 2778 | 3584 | 3809 | 3012 | 2446 | 3290 |
| 1987 | 4293 | 3429 | 2857 | 3677 | 3809 | 3097 | 2408 | 3362 |
| 1988 | 3848 | 3276 | 2782 | 3440 | 3986 | 3000 | 2636 | 3373 |
| 1989 | 3816 | 3370 | 2777 | 3429 | 3769 | 3084 | 2423 | 3280 |
| 1990 | 4138 | 3413 | 2834 | 3563 | 3935 | 2928 | 2528 | 3264 |
| 1991 | 4380 | 3625 | 2942 | 3775 | 3672 | 2687 | 2251 | 3043 |
| 1992 | 4231 | 3183 | 3030 | 3512 | 3677 | 2932 | 2736 | 3253 |
| 1993 | 4271 | 3263 | 2907 | 3601 | 4216 | 2846 | 2364 | 3462 |
| 1994 | 3401 | 3080 | 2840 | 3344 | 3603 | 2868 | 2470 | 3393 |
| 1995 | 3923 | 3292 | 2814 | 3603 | 3583 | 3062 | 2525 | 3427 |
| 1996 | 3890 | 3061 | 2646 | 3534 | 3820 | 3007 | 2282 | 3477 |
| 1997 | 4289 | 3369 | 2843 | 3670 | 4139 | 2862 | 2519 | 3526 |
| 1998 | 4039 | 3536 | 2768 | 3555 | 4170 | 2966 | 2772 | 3807 |
| 1999 | 4093 | 3470 | 2924 | 3612 | 4142 | 3315 | 2965 | 3752 |

**මූලය : ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව**

**දී භූමියෙහි ඵලදායිතාවය එමගින් ලබාගත හැකි ඵලදායිතාවයට වඩා අඩු මට්ටමක පවතී.** එයට ප්‍රධාන හේතුව වන්නේ ජල හිඟය සහ ගොවිපොල කටයුතු සඳහා පහසුකම් නොමැති වීමයි.

**ශ්‍රමයෙහි ඵලදායිතාවය පෙන්වන දර්ශකය, බොහෝ දුරට භූමියෙහි ඵලදායිතාවය සහ කෘෂිකාර්මික අංශයෙහි භූමිය - මිනිසා අතර ඇති අනුපාතයට (Land - Man Ratio) සමානය.**

## ශ්‍රමයෙහි ඵලදායිතාව

**ශ්‍රමයෙහි ඵලදායිතාව පෙන්වන දර්ශකය බොහෝ දුරට භූමියෙහි ඵලදායිතාවය සහ කෘෂිකාර්මික අංශයෙහි භූමිය-මිනිසා අතර ඇති අනුපාතයට (Land - Man Ratio) සමාන ය.** ශ්‍රමයෙහි ඵලදායිතාව ආර්ථික කාර්යක්ෂමතාවය මනින වැදගත් දර්ශකයක් ලෙස භාවිතා කෙරේ. ශ්‍රමයෙහි ඵලදායිතාව හැදින්වීමේ ප්‍රතිශතයක් වශයෙන් ගොවිපොල ආදායම ඉහළ යන අතර එමගින්, ගොවියාගේ ජීවන මට්ටමේ වැඩි දියුණුවක් ලබා කර ගත හැකිය. නිමැවුමෙහි ඉහළ දැමීම තුළින් ශ්‍රමයේ ඵලදායිතාවයේ වර්ධනයක් ඇතිකර ගත හැකිය. ශ්‍රී ලංකාවේ වී වගාවේ ඵලදායිතාව දක්වෙන මූලාශ්‍ර වලදී භූමියෙහි ඵලදායිතාව මෙන්ම ශ්‍රමයෙහි ඵලදායිතාවය භාවිතයට ගැනේ. එහි දී ශ්‍රමයෙහි, මිනිස් දිනකට අස්වනු ප්‍රමාණය හෝ එක් ශ්‍රම ඒකකයක් සඳහා අස්වනු ප්‍රමාණය වශයෙන් නිර්නායකයන් භාවිතා කෙරේ.

## වී නිෂ්පාදනයේ ඵලදායිතාව ඉහළ නංවන්නේ කෙසේද?

වී වගාවේ ඵලදායිතාව ඉහළ දැමීම සඳහා භාවිතා කළ හැකි විධික්‍රම කිහිපයකි.

+ වගා වපසරිය ඉහළ දැමීම
+ වගා විධික්‍රමය සඳහා නව තාක්ෂණය භාවිතය
+ වැඩි දියුණු කළ බීජ භාවිතය
+ රසායනික පොහොර / කෘමිනාශක/දිලීර නාශක/ වල් නාශක භාවිතය

## පිරිවැය අවම කර ගැනීම

**හරිත විප්ලවයේ භාවිතයන් හේතුවෙන්, 1960 න් පසු, වී නිෂ්පාදනයේ විශාල ප්‍රගතියක් දක්නට ලැබුන ද ඵලදායිතාව ඉහළ නැගීම සිදුවී ඇත්තේ සුළු වශයෙනි.** ඒ සඳහා දරන ලද ආයෝජනයන් හා සැලකීමේ දී ඵලදායිතාව වර්ධනය වී ඇත්තේ නොසැලකිය යුතු අගයකිනි. වී නිෂ්පාදනයේ ඵලදායිතා නිර්නායකයන් සැලකීමේ දී දකුණු ආසියාවේ සෙසු රටවල් අභිබවා සිටිය ද **කොරියාව, ජපානය, චීනය** හා **තායිලන්තය** වැනි රටවල ඵලදායිතා අගයන්ට වඩා අඩු මට්ටමක පසුවේ. විශේෂයෙන්ම, **යෙදවුම් පිරිවැය ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන්, නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීම පිළිබඳ ගැටළුවට ශ්‍රී ලාංකීය ගොවියා අද මුහුණ දී සිටී.** මේ හේතුව නිසාම වී නිෂ්පාදනය සම්බන්ධයෙන් ගොවීන් දක්වන්නේ පසුගාමී ආකල්පයකි. විශේෂයෙන්ම, තරුණ පරපුර වී නිෂ්පාදනයෙන් ඈත්වීමක් මෑත කාලීනව දක්නට ලැබේ.

**යෙදවුම් පිරිවැය ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන්, නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීම පිළිබඳ ගැටළුවට ශ්‍රී ලාංකික ගොවියා අද මුහුණ දී සිටී.**

වී නිෂ්පාදනයේ දී ඵලදායිතාව ඉහල නැංවීම සඳහා අනුගමනය කරන විධික්‍රමයන් පිළිබඳව නැවත සලකා බැලිය යුතු කාලය එළඹ තිබේ. ඇතැම් විධික්‍රමයන් බැහැර කළ නොහැකිවා පමණක් නොව, පිරිවැය තත්ත්වයන් වෙනස් කළ නොහැකි බව සත්‍යයකි. නමුත් වෙනස් කළ හැකි විධික්‍රම පිළිබඳව අවධානය යොමු කළ යුතු වේ. ඒ මගින් පිරිවැය අවම කර ගැනීමටත් ඵලදායිතාව ඉහළ නංවා ගැනීමටත් අවධානය යොමු කළ යුතුය. මේ සම්බන්ධයෙන් ගොවිපල කළමනාකරණය ඉතා වැදගත් සාධකයකි. එය සම්පත් අතර, ව්‍යවසාය යටතේ ගැනේ. මෙහි දී වී නිෂ්පාදනය සම්බන්ධයෙන් විධිමත් ගොවිපල කළමණාකරණයක් අනුගමනය කරන්නේද යන්න ගැන විමසා බැලිය යුතුය.

විධිමත් ගොවිපල කළමනාකරණයක් තුළින් හා සුදුසුතම ක්‍රියාමාර්ග (Best Practice) අනුගමනය කිරීම තුළින් විවිධ තාක්ෂණික මට්ටම් යටතේ ඵලදාව ඉහළ නංවා ගත හැකිවේ. මේ අනුව, ලබාගත හැකි ඵලදායිතා මට්ටම් හතරකි.

1. **සත්‍ය ඵලදාව**
   Actual yield (A)
2. **සුදුසුතම ගොවිපල ක්‍රියාමාර්ග තුළින් ලබා ගත හැකි ඵලදාව**
   Best practice yield (BP)




3. **පර්යේෂණයන් මගින් ලබාගත හැකි ඵලදාව**
Research potential yield (RP)

4. **විද්‍යාත්මක ක්‍රම භාවිතයෙන් ලබාගත හැකි ඵලදාව**
Science potential yield (SP)

මේ අනුව, ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් ඒ ඒ රටෙහි, සම්පත් උපරිම ලෙස උපයෝජනයට ගෙන ලබාගත හැකි උපරිම ඵලදායිතාව ලබා ගැනීම සඳහා සැළසුම් සකස් කළ යුතුව තිබේ.

**විවිධ තාක්ෂණික මට්ටම් යටතේ ලබාගත හැකි ඵලදායිතා මට්ටම් සහ ඵලදායිතාවේ වෙනස්කම්**
**විවිධ තාක්ෂණික මට්ටම්**

මේ අනුව, විවිධ තාක්ෂණික මට්ටම් යටතේ ඵලදායිතාවයන් හෝ වෙනස්කම් තුනක් හඳුනාගෙන තිබේ.

1. සුදුසුතම ක්‍රියාමාර්ග අනුගමනය නොකිරීම නිසා ඵලදායිතාවයේ ඇතිවන වෙනස
The Extention gap (BP -A)
2. පර්යේෂණ නොකිරීමෙන් ඵලදායිතාවයේ ඇතිවන වෙනස
The Research gap (Rp - BP)
3. විද්‍යාත්මක ක්‍රම භාවිතා නොකිරීම නිසා ඵලදායිතාවයේ ඇතිවන වෙනස
The science gap (SP-RP)

මේ අනුව, රටක පවතින සම්පත් සුසංයෝගයෙන් ලබාගත හැකි උපරිම ඵලදායිතාව ලබාගැනීමට මනා ගොවිපල කළමනාකරණය උපයෝගි කොට ගත යුතුය. ඒ අනුව, අවම පිරිවැය තත්ත්වයන් යටතේ උපරිම ඵලදායිතාවක් ලබා ගැනීම සඳහා ක්‍රමෝපායයන් සැකසිය යුතුවේ.


**ටී.පී. සෝමරත්න**
**සංඛ්‍යාන නිළධාරී**
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය


# "ගොවි ජනතා"

**"ගොවි ජනතා"** සඟරාව පිළිබඳව ඔබ දක්වන අදහස් හා ප්‍රතිචාර අපි ඉතා අගේ කොට සළකමු. එසේම එවා ඉදිරි කලාපයන්හි පල කිරීමට ද කටයුතු කෙරේ. එබැවින් එවැනි ද සංස්කාරක වෙත දන්වා එවන ලෙසට පාඨක ඔබට ආරාධනා කරමු.

**සංස්කාරක**
**ගොවි ජනතා**
**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා**
**පුහුණු කිරීමේ ආයතනය**
**තැ.පෙ. 1522,**
**විජේරාම මාවත,**
**කොළඹ 07.**